# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# மருத்துவப் பட்டப் பின்படிப்பு நிறுவனம்

# POSTGRADUATE INSTITUTE OF MEDICINE



## වාර්ෂික වාර්තාව 2012

## வருடாந்த அறிக்கை 2012

## ANNUAL REPORT 2012

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# වාර්ෂික වාර්තාව

✦
✦

2012

# පටුන


1. අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය........ 03
    1.1 ආයතනයේ දර්ශනය........ 04
    1.2 ආයතනයේ මෙහෙවර........ 04
2. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණු........ 05
    2.1 ඓතිහාසික පසුබිම........ 06
3. උපකුලපතිතුමියගේ සමාලෝචනය ........ 07
4. සම්පත් සහ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර........ 08
5. දේශිය පුහුණුව ලබන අභ්‍යාසලාභීන්ට අදාල තොරතුරු........ 09
6. විදේශ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර........ 09
7. පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු........ 09
8. වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර........ 09
9. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර........ 10
10. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර........ 10
11. දේශීය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘති........ 10
12. දේශීය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘතිවල වැය පිළිබඳ විස්තර........ 10
13. මූල්‍ය ප්‍රගතියට අදාළ විස්තර (වැයකිරීම්)........ 11
14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)........ 11
15. මූල්‍ය කටයුතු හැසිරවීම් පිළිබඳ විශ්ලේෂණය-2012........ 11
16. 2012 වර්ෂය තුළදී ලත් යටිතල පහසුකම් පිළිබඳ විස්තර........ 11
17. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය සාධනය........ 12
    වගුව 4........ 13
    වගුව 5........ 14
18. අධ්‍යයන කටයුතු ........ 15
    18.1 වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය........ 17
19. පුස්තකාලය........ 18
    19.1 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශාඛා පුස්තකාලය, පේරාදෙණිය........ 20
20. කාර්ය මණ්ඩලය........ 22
21. මූල්‍ය කටයුතු ........ 25
22.
    (අ) කළමණාකරණ මණ්ඩලය-2012........ 31
    (ආ) 2012 වර්ෂයේ ආයතනයේ බලමණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු........ 32
    (ඇ) බාහිර පරීක්ෂකවරු පිළිබඳ විස්තර-2012........ 33
    (ඈ) විදේශ පුහුණුව-2012........ 34
23. විගණන වාර්තාව........ 38

## 01. අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

මා දරණ තනතුරේ පළමු වසර අවසානයේ දී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2012 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලාංකීය ජනතාවට කලාපයට සහ ලෝකයට උපරිම මානුෂීය සෞඛ්‍ය සත්කාරය ලබා දීමේ අරමුණෙන් " වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවර සහ එහි දැක්ම වන " ඉතා උසස් තත්වයේ දක්ෂතම, කැපවීමෙන් සේවය කරන විශේෂඥයින් සහ වෘත්තිකයින් බිහි කිරීමය". ඒ අනුව රටේ අවශ්‍යතාවයක් සපුරාලීමට හැකිවන පරිදි විශේෂඥ වෛද්‍යවරුන් වර්ධනය කිරීම සඳහා, පසුගිය තිස් වසර තුළ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය බොහෝ සෙයින් දායකත්වය ලබා දී ඇත. ඉහත සඳහන් මෙහෙවර ශාක්සාත්කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් වැඩි දුරටත් පුලුල් කිරීම සඳහා, 2012 වර්ෂය තුල දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඉතා යෝග්‍ය වූ ක්‍රියා මාර්ගයන් ගෙන ඇත.

පුහුණු වැඩසටහන් 90 ක සිටින ශිෂ්‍ය සංඛයාව 2387 කි.පුහුණු වැඩසටහන් වලට ලියාපදිංචිවූ නවක ශිෂ්‍ය සංඛ්‍යාව 642 ක් වූ අතර සිසුන් 697 දෙනෙක් උපාධිධාරීන් වූහ. වර්ෂය තුල දී මණ්ඩල සහතිකය ලත් විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 212 කි. පරීක්ෂණ 87ක් වර්ෂය තුල දී පැවැත් වූ අතර සියළුම වෛද්‍ය විශාරද පරීක්ෂණ සඳහා සහ එහි තත්වයන් පවත්වා ගැනීම සඳහාත්, විදේශීය රටවල පිළිගැනීම සඳහාත්, විදෙස් රටවල පරීක්ෂකවරු සහභාගී වූහ.

ස්ථාපිත පුහුණු වැඩ සටහන්වල විෂය නිර්දේශිකයන් ඉහල නැංවීම සඳහාත් 2013 වර්ෂයේ දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සක්‍රීයව ක්‍රියාත්මක විය. මෙයට අමතරව අධ්‍යයන සහ පරීක්ෂණ කටයුතු විධිමත් කිරීමට මෙහෙයුම් නිර්නායක ලේඛන ඉදිරිපත් කරන ලදී. සාමුහික ප්‍රයත්නයන් හේතුවෙන් 2012 වර්ෂයේ දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එරෙහිව නඩු අවස්ථා වැලැක්වීමට හැකි විය.

පුහුණු වන්නන්ගේ පර්යේෂණ යෝජනා අනුමත කිරීම පහසු කිරීම සඳහා වූ සදාචාරාත්මක සමාලෝචන කමිටුව සහ පරීක්ෂණ පිළිබඳව පැමිණිලි පිළිබඳ සලකා බැලීම පිළිබඳ කොමිටුවක්ද ස්ථාපිත කර ඇත.

වර්ෂය තුල දී පුහුණු වැඩසටහන් සහ පරීක්ෂණ කටයුතු වර්ධනය වුව ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය, මූලාධාර සහ යටිතල පහසුකම් පිළිබඳ ඊට සාපේක්ෂ වැඩි දියුණුවක් දක්නට නොලැබුනි. අතිරේක කාර්ය මණ්ඩලය, මූලාධාර සහ නව ගොඩනැගිල්ලක් සඳහා වූ යෝජනාවක් අනුමැතිය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටත් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳ කඩිනම් අවධානයක් සහ නිවැරදි ක්‍රියා මාර්ග ගැනීම අත්‍යාවශ්‍යව පවතී.

ස්වේච්ඡා පදනමක් මත සේවය ලබාදුන් කළමණාකරණ මණ්ඩල සාමාජික භවතුන්ගේ, අධ්‍යයන මණ්ඩල, පරීක්ෂණ මණ්ඩල, විශේෂණ මණ්ඩල සාමාජික භවතුන්ගේ ද පුහුණු කරවන්නන් සහ පරීක්ෂකවරුන්ගේ දායකත්වය මම ඉතා අගය කොට සලකමි. අඩුපාඩුකම් සහ අභියෝග තිබිය දී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යක්ෂමභාවය සහ කැපවීම අතිශයින්ම ප්‍රසංශා කටයුතුය.

මහාචාර්ය ජයන්ත ජයවර්ධන
අධ්‍යක්ෂ /වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කායික වෛද්‍යවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
කොළඹ විශ්වවිද්‍යාලය

## ආයතනයේ දර්ශනය හා මෙහෙවර

### 1.1දර්ශනය (Vision )

පරිපාලනමය හා මූල්‍යමය වශයෙන් ස්වාධීන, විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් ලෙස ජාත්‍යන්තරව පිළිගනු ලබන, දිවයිනේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස ඉහළ වෘත්තීය ප්‍රමිතීන්ගෙන් පරිපූර්ණ විශේෂඥ වෛද්‍යවරුන් සහ වෙනත් වෘත්තිකයන් බිහිකරන කලාපීය හා ලෝක සෞඛ්‍ය සේවාවන්ට සාධනීය මට්ටමින් දායකත්වය ලබාදෙන ආයතනයක් වීමත් ස්වාධීන විශ්වවිද්‍යාල තත්ත්වයක් ලබාගැනීමත් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනය වේ.

### 1.2 මෙහෙවර (Mission )

කලාපීය හා ලෝක මට්ටමින් අප වෙත පැවරී ඇති පුළුල් වගකීම් සම්භාරය පිළිබඳව අවබෝධයෙන් යුතුව, ශ්‍රී ලංකාවාසීන්ට ප්‍රශස්ථ මානවවාදී සෞඛ්‍ය සේවාවක් සැපයීමට කැපවූ වෘත්තීය කුසලතාවන්ගෙන් හා ඉහළ ප්‍රමිතීන්ගෙන් පරිපූර්ණ විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් වෘත්තිකයන් බිහි කරලීමට අවශ්‍යවන්නා වූ පශ්චාත් උපාධි මට්ටමේ ශාස්ත්‍රීය පාඨමාලා හා පුහුණු වැඩ සටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමත් ඒවා අධීක්ෂණයත් එමෙන්ම ඇගයීම් ක්‍රම සැලසුම් කිරීමත් මෙම ආයතනයේ මෙහෙවර වේ.

## 02. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණු

1. ජාතික අවශ්‍යතාවට සරිලන ප්‍රමාණයෙන් හා ඉහළ ගුණාත්මක භාවයෙන් පිරිපුන් විශේෂඥ වෛද්‍යවරුන් බිහි කිරීම.

2. අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපනය තුළින් වෛද්‍යවරුන්ගේ හැකියාවන් හා නිපුණතා වර්ධනයට කටයුතු කිරීම.

3. වෛද්‍ය වෘත්තිකයන්ගේ අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපන කටයුතු නැංවීම පහසුවන ආකාරයට ක්‍රම වේදයන් සැලසුම් කිරීම හා අභිනව ක්‍රම වේදයන් බිහි කිරීම.

4. වෛද්‍ය වෘත්තිකයන් තුල වර්ධනාත්මක ආකල්පයන් පෝෂණය හා ඔවුන් තුල ස්වයං අධ්‍යයන හැකියා ප්‍රවර්ධනය.

5. පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා උචිත තාක්ෂණය උපයෝගී කර ගැනීමත් පවතින සම්පත් හැකි උපරිම අයුරින් භාවිතයත් වර්ධනය කිරීම.

6. සෞඛ්‍ය ගැටළු නිරාකරණය සඳහා සෞඛ්‍යාරක්ෂක කණ්ඩායම් ප්‍රවේශ සංකල්පය යොදා ගැනීමේ වැදගත්කම අවබෝධ කරවීම.

7. පවතින දෝෂ තත්වයන් වෙතොත් ඒවාද, ප්‍රවර්ධනය සඳහා අදාලවන දර්ශකයන් ද හඳුනා ගැනීමේ අරමුණින් පුහුණු අධ්‍යාපන පාඨමාලාවන් සමාලෝචනයට ලක් කිරීම.

8. රෝග වැළැක්වීම්, චිකිත්සා හා හෙද ආරක්ෂණ සේවා මැනවින් සමෝධානය වන ආකාරයෙන් සේවාස්ථ පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම.

9. ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු ඉහළ පිරිවිතරයන්ට අනුකූල වන ආකාරයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්ජාතික අධ්‍යාපන ආයතන සමඟ සබඳතා පුළුල් කර ගැනීම.

## 2.1 ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපන කටයුතු 1870 වර්ෂයේදී කොළඹ වෛද්‍ය විද්‍යාලය පිහිටුවීමත් සමගම ආරම්භ විය. මෙම වෛද්‍ය විද්‍යාලය වසර 70 ක කාලයක් ස්වාධීන ආයතනයක් වශයෙන් පැවතුණි. අනතුරුව එය 1942 වර්ෂයේ දී පිහිට වූ ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය බවට පත්විය.

1952 වර්ෂයේ දී පවත්වන ලද කායික වෛද්‍යවේදය පිළිබඳ වෛද්‍ය විශාරද උපාධි පරීක්ෂණයත්, ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය පිළිබඳ ශල්‍ය විද්‍යාපති උපාධි පරීක්ෂණයත් 1953 වර්ෂයේ දී පවත්වන ලද ශල්‍යවේදය පිළිබඳ ශල්‍ය විද්‍යාපති උපාධි පරීක්ෂණයත් ලංකා විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද මුල්ම පශ්චාත් උපාධි වෛද්‍ය පරීක්ෂණයන් ලෙස හැඳින්විය හැකිය. මෙම අවධියේදී පශ්චාත් උපාධි පරීක්ෂණයන් ඉලක්ක කොට පවත්වනු ලැබූ සංවිධානාත්මක සේවාස්ථ පුහුණු, පුහුණු වැඩ සටහන් හෝ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා කිසිවක් නොතිබුණි. එක්සත් රාජධානියේ රාජකීය වෛද්‍ය විද්‍යායතන මගින් පිරිනමන ලද මනෝ වෛද්‍යවේදය, ව්‍යාධිවේදය, ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය, කායික වෛද්‍යවේදය හා ශල්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික එම අවධියේදී විශේෂඥ වෛද්‍ය පුරප්පාඩු පිරවීම සඳහා මූලික සුදුසුකමක් ලෙස මෙරට සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගෙන තිබුණි. එබැවින් පශ්චාත් උපාධි වෛද්‍ය පාඨමාලා හැදෑරීමටත් සේවාස්ථ විශේෂඥ පුහුණුව සඳහාත් එම අවධියේදී මෙරට වෛද්‍යවරුන්හට එක්සත් රාජධානිය බලා යාමට සිදු වීය.

මෙම තත්ත්වය සලකා බැලූ පශ්චාත් උපාධි අධ්‍යාපන උපදේශක කමිටුව රාජකීය වෛද්‍ය විද්‍යායතන මගින් සකස් කර තිබූ පුහුණු පාඨමාලා හැදෑරීමේ අවශ්‍යතාවය වෙනුවට මෙරට මහ රෝහල්වලදී දේශීය විශේෂඥ වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ ලබන්නා වූ වසර 03 ක සේවාස්ථ පුහුණුවත් ඉන් අනතුරුව ලබන්නාවූ වෛද්‍ය විශාරද හා ශල්‍ය විද්‍යාපති උපාධි සාමාර්ථයත් අදාල සුදුසුකම් වශයෙන් පිළිගතයුතු යයි 1973 වර්ෂයේ දී රජය වෙත නිර්දේශ කළේය.

එම නිර්දේශයට අනුකූලව රජය විසින් 1972 අංක 1 දරණ ලංකා විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය ස්ථාපනය කරන ලදී. එම ආයතනය පිහිටුවීමේ අරමුණ වූයේ පශ්චාත් උපාධි පරීක්ෂණ පැවැත්වීමය. 1976 මාර්තු මස 02 වැනි දින දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ නේවාසික නියෝජිත හාෆ්ඩන් මහ්ලර් මහතා විසින් එය නිල වශයෙන් විවෘත කරන ලද අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදි.

කෙසේ වෙතත්, එක්සත් රාජධානියේ රාජකීය වෛද්‍ය විද්‍යායතන විසින් සිය පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණ මෙරට තුල තවදුරටත් පවත්වාගෙන යන ලදී, එම පරීක්ෂණ වලට පෙනී සිටීමට වෛද්‍යවරුන් වැඩි කැමැත්තක් දැක්වීම නව ආයතනයේ පරීක්ෂණ පැවැත්වීමට අහිතකර අන්දමින් බලපෑවේය. මේ තත්ත්වය සමාලෝචනයට ලක් කළ රජය 1980 ජනවාරි 01 වන දින සිට බලපාන පරිදි විදේශීය ආයතනයන් මගින් මෙරට තුළ පශ්චාත් උපාධි වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම අත්හිටුවීමට කටයුතු කළේය. එමෙන්ම, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සමත් වන විශේෂඥ වෛද්‍යවරුන්හට රාජ්‍ය පිළිගැනීම ලබා දීමටත්, විශේෂඥ වෛද්‍ය තනතුරු පිරවීමේදී එම සමාර්ථ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමටත් කටයුතු කරන ලදී.

1979 වර්ෂයේදී, එවකට පැවති පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය වෙනුවට 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ සඳහන් ප්‍රතිපාදන යටතේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවන ලදි. එහි ප්‍රථම අධ්‍යක්ෂ ලෙස වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා පත්කරන ලදි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අදාල පණතේ විධිවිධානවලට අනුකූලව අනුමත කරන ලද අතර එය 1980 අප්‍රියෙල් 10 දින සිට බලාත්මක කරන ලදි. විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ පිහිටුවා තිබූ අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරන ලද අතර පුහුණු පාඨමාලා හා පරීක්ෂණ විධිද ඒ අනුව යළි සකස් කරන ලදි.

අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨ සහ වෘත්තීය විද්‍යායතන සමග වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඉතා සමීප සබඳතාවයකින් යුතුව කටයුතු කරයි. එහි කළමණාකරණ මණ්ඩලය අධ්‍යාපන, මුදල් සහ සෞඛ්‍ය යන අමාත්‍යාංශවල ලේකම්වරුන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය පීඨ පීඨාධිපතිවරුන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ එම කොමිෂම විසින් පත්කරනු ලබන විශිෂ්ඨ ගණයේ වෘත්තීයවේදීන් 08 දෙනෙකුගෙන් ද සමන්විත වේ.

## 03. උපකුලපතිතුමියගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීමක්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1980 අංක 01 දරණ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ පිහිටුවන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරන ලදී. මෙම ආයතනය වෛද්‍ය ක්ෂේත්‍රයේ මූලික සහ උප විෂය ක්ෂේත්‍රයන්හි පාඨමාලා පැවැත්වීමත් පුහුණු කටයුතුත් පර්යේෂණ පැවැත්වීමත් ඉටු කරනු ලබයි. වෛද්‍ය විශාරදපති උපාධි මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පරීක්ෂණ සඳහා වෛද්‍ය සහ දන්ත වෛද්‍යවරුන් පුහුණු කිරීමත් අවසන් පරීක්ෂණ සමත් වන අපේක්ෂකයන් සඳහා එම උපාධි සහ සහතිකපත්‍ර පිරිනැමීම සිදු කෙරේ. විශේෂඥ පුහුණු පාඨමාලා සාර්ථකව හදාරනු ලබන උපාධිධාරීන් හට විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් මාණ්ඩලික සහතිකය පිරිනැමීම ද මෙම ආයතනයෙන් සිදුකෙරේ.

(ආ) ජයග්‍රහණ

මෙරටට අවශ්‍යය විශේෂඥ වෛද්‍යවරුන් බිහිකිරීමේ ලා පසුගිය වසර 30 ක පමණ කාලයක් තුල ඉමහත් කාර්යභාරයක් මෙම ආයතනය විසින් ඉටුකරනු ලැබ ඇත.

(ඇ) අසමර්ථතා හා සාධාරණීකරණය

ප්‍රමාණවත් තරම් ගොඩනැගිලි පහසුකම් නොමැතිවීමත් ආයතනය ව්‍යාප්ත කිරීමට අවශ්‍යය ඉඩම් ප්‍රමාණයක් නොමැතිවීමත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මණ්ඩලයන් බඳවා ගැනීමට අවශ්‍යය ප්‍රතිපාදන නොලැබීමත් ආයතනයේ සංවර්ධනයට එරෙහිවන ප්‍රධාන බාධක ලෙස දැක්විය හැකිය.

(ඈ) අනාගත සැලසුම්

සායනික නොවන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව නව පාඨමාලා හඳුන්වාදීමට ආයතනය සැලසුම් කොට ඇත.

ආයතනයේ ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමි.

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
උපකුලපතිනි
කොළඹ විශ්විද්‍යාලය

## 04. සම්පත් සහ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර

| පාඨමාලා | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| සේවාස්ථ පුහුණු | 123 | |
| සහතික පත්‍ර පාඨමාලා | 80 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 450 | |
| විද්‍යාපති උපාධි පාඨමාලා | 176 | |
| වෛද්‍ය විශාරද | 1558 | |
| **එකතුව** | **2387** | |
| | | |
| | | |
| **මාණ්ඩලික නිලධාරීන්** | | |
| අධ්‍යක්ෂ | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 01 |
| | | |
| | | |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - | 01 |
| ආධුනික කථිකාචාර්ය | | 01 |
| අර්ධකාලීන පාඨමාලා අධ්‍යක්ෂ (වෛද්‍ය පරිපාලන හා ප්‍රජා වෛද්‍ය) | - | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්ථකාලයාධිකාරී | - | 02 |
| සහකාර පුස්ථකාලයාධිකාරී | - | 01 |
| වැඩසටහන් සම්පාදක හා පද්ධති විශ්ලේෂක | - | 01 |
| සහකාර ජාල කළමණාකරු | - | 01 |
| | | |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | | |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරී | - | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | - | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | - | 01 |
| සහකාර ලේඛකාධිකාරී | - | 03 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | - | 11 |
| මාණ්ඩලික සහකාර | - | 10 |
| ලිපිකාර හා සමාන්තර සේවා | - | 32 |
| කනිෂ්ඨ සේවක හවතුන් | - | 17 |

## 05. දේශියව පුහුණුව ලබන අභ්‍යාසලාභීන්ට අදාල තොරතුරු

| පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව | පලමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිධාරී සංඛ්‍යාව | සිව්වන වසර | පස්වන වසර | හයවන වසර |
|---|---|---|---|---|---|---|---|---|
| සේවාස්ථ | 42 | 79 | 23 | 21 | | | | |
| පශ්චාත් උපාධි සහතික පත්‍ර | 45 | 80 | | | | | | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 248 | 396 | 54 | | 152 | | | |
| විද්‍යාපති උපාධි | 94 | 146 | 29 | | 60 | | | |
| වෛද්‍ය විශාරද | 213 | 448 | 242 | 96 | 226 | 364 | 48 | 4 |
| විදේශ පුහුණු | | | | | | | 319 | 35 |
| **එකතුව** | **642** | **1149** | **348** | **117** | **438** | **364** | **367** | **39** |

## 06. විදේශ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර

| පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව | පලමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| වෛද්‍ය විශාරද නීති වෛද්‍යවේදය | | | | 01 | |
| වෛද්‍ය විශාරද චර්ම වෛද්‍යවේදය | | | 01 | | |
| ජීව වෛද්‍ය විඥාපන විද්‍යාපති | | | 01 | | 01 |
| **එකතුව** | | | **02** | **01** | **01** |

## 07. පර්යේෂන නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබද තොරතුරු

**සඟරා**

1. දිල්හානි මුණසිංහ, ටී ශ්‍රීදරන් හා එල් කේ වේරගල යන මහත්මීන් විසින් සම්පාදනය කරන ලද පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් විසින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත ලබා දෙන උපාධි නිබන්ධන හා පර්යේශන වාර්තා පිළිබඳ සංශිප්ත ග්‍රන්ථ නාමාවලිය.

**වාරසඟරා ලිපි**

1. 'පරිපූර්ණ සමාජයක් උදෙසා ජාතික කියවීමේ මාසය' මැයෙන් ටී ශ්‍රීදරන් මහත්මිය විසින් රචිත ලිපිය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල පරිශ්‍රයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

**වෙනත්**

1. දකුණු ආසියානු පදනම විසින් සංවිධානය කරන ලද උතුරු හා නැගෙනහිර පොදු පුස්තකාලයාධිපතිවරන් සඳහා වූ සම්මන්ත්‍රණයේදී ටී ශ්‍රීදරන් මහත්මිය විසින් 'ශ්‍රී ලංකාවේ පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය' නම් මාතෘකාව අළලා කෙරුණු ඉදිරිපත් කෙරීම.

## 08. වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගිත්වය | නිමා කිරීම් | ඉදිරිපත්කිරීම් |
|---|---|---|---|
| (අ) පශ්චාත් උපාධි විශේෂඥ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 29 | 29 | වැඩමුළු - 07 |
| (ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | 18 | 18 | |
| (ඇ) උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | |
| (ඈ) ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | |
| (ඉ) සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 4 | 4 | |
| (ඊ) වෙනත් | | | |
| **එකතුව** | **51** | **51** | |

## 9. පුනරාවර්ථන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2011<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|
| (අ) පුද්ගල වේතන | 55,560,806/- | 57,998,795/- |
| (ආ) ගමන් වියදම් | 4,753,703/- | 6,456,654/- |
| (ඇ) සැපයුම් | 7,401,484/- | 7,381,951/- |
| (ඈ) නඩත්තු | 2,336,660/- | 2,547,246/- |
| (ඉ) කොන්ත්‍රාත්සේවා | 14,797,822/- | 15,461,149/- |
| (ඊ) වෙනත් පුනරාවර්ථන වැයකිරීම් | 34,094,945/- | 40,306,667/- |
| (උ) පශ්චාත් උපාධි පුහුණු වැය | 25,605,605/- | 35,908,875/- |
| **එකතුව** | **144,551,025/-** | **166,061,337/-** |

## 10. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2011<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|
| (අ) ලීබඩු සහ උපකරණ අත්පත් කරගැනීම් | 8,779,951/- | 1,754,373/- |
| (ආ)රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්පත් කරගැනීම් | 927,418/- | 1,658,380/- |
| (ඇ)ගොඩනැගිලි අත්පත් කරගැනීම් සහ ව්‍යුහ වැඩිදියුණු කිරීම් | - | 2,157,510/- |
| (ඉ) ග්‍රන්ථ සහ වාර සඟරා මිළදී ගැනීම් | 14,917,780/- | 18,701,513/- |
| (ඊ) වෙනත් (වාහන) | 4,150,000/- | 7,350,000/- |
| (උ) වත්කම් පුනරුත්ථාපනය හා අළුත්වැඩියා කිරීම් | 3,187,830/- | 160,878/- |
| **එකතුව** | **31,962,979/-** | **31,782,655/-** |

## 11. දේශිය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘති

| නම සහ විස්තර | ණය/ ප්‍රදාන | ඒජන්සිය | පූර්ණ වැය ඇස්තමේන්තුව | RFA | DF |
|---|---|---|---|---|---|
| (අ) ජීව වෛද්‍ය විඥානය පිළිබඳ විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු සඳහා වන නෝරාඩ් වැඩසටහන (NOMA) | ප්‍රදානයකි | ඔස්ලෝ විශ්වවිද්‍යාලය | 116,886,150/- | අදාල නොවේ | අදාල නොවේ |
| (ආ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන | ප්‍රදානයකි | | 7,568,536/- | අදාල නොවේ | අදාල නොවේ |
| **එකතුව** | | | **124,454,686/-** | | |

වාර්ෂික මූල්‍ය ප්‍රදානය ව්‍යාපෘති ආරම්භයේදීම ලබාදේ.

## 12. දේශිය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘතිවල වැය පිළිබඳ විස්තර

| නම | පූර්ණ වැය ඇස්තමේන්තුව | 2011 වසරේ වැය | 2012 වසරේ වැය | 2012-12-31 දිනට එකතුවූ වැය |
|---|---|---|---|---|
| (අ) ජීව වෛද්‍ය විඥානය පිළිබඳ පති උපාධි අධ්‍යයන කටයුතු සඳහා වන නෝරාඩ් වැඩසටහන (NOMA) | 116,886,150/- | 46,717,402/- | 7,403,914/- | 99,313,950/- |
| (ආ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන | 7,568,536/- | 1,677,392/- | 736,947/- | 5,895,747/- |
| **එකතුව** | **124,454,686/-** | **48,394,794/-** | **8,140,861/-** | **105,209,697/-** |

## 13. මූල්‍ය ප්‍රගතියට අදාල විස්තර (වැයකිරීම්)

| විෂය | රජයේ ප්‍රතිපාදන 2012 | ලද ආදායම 2012 | 2012 වසරේ වැය | ඉතිරිකිරීම් / අතිරික්තය |
|---|---|---|---|---|
| (අ) ව්‍යාපෘතිමය නොවන පුණරාවර්ථන වැය | 62,750,000/- | 117,081,361/- | 166,061,377/- | 13,770,024/- |
| (ආ) ව්‍යාපෘතිමය නොවන ප්‍රාග්ධන වැය | 7,855,000/- | - | 31,782,655/- | (23,927,655)/- |
| (ඇ)ව්‍යාපාතිය-දේශිය අරමුදල් | - | - | - | - |
| (ඈ) ව්‍යාපෘතිය - විදේශිය අරමුදල් | - | - | - | - |
| **එකතුව** | **70,605,000/-** | **117,081,361/-** | **197,843,992/-** | **(10,157,631)/-** |

2012 වර්ෂය සඳහා වන මුලු මූල්‍ය ප්‍රතිපාදනය මිලියන 63.7ක් වූ අතර භාන්ඩාගාරයෙන් පුණරාවර්තන වියදම් සඳහා රුපියල් මිළියන 62.75 ක් ලැබින.

## 14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)

| මූල්‍ය ප්‍රභවය | 2012 වසර සඳහා වූ ප්‍රතිපාදන රුපියල් | 2012 වසරේදී මුළු ඉපැයිම් රුපියල් | හිගය/අතිරික්තය රුපියල් |
|---|---|---|---|
| (අ) ප්‍රථම උපාධි අධ්‍යයන කටයුතු | - | - | - |
| (ආ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු | 99,300,000/- | 102,938,946/- | 3,638,946/- |
| (ඇ) උපදේශක සේවා | - | - | - |
| (ඈ) වෙනත් | 13,000,000/- | 14,142,415/- | 1,142,415/- |
| **එකතුව** | **112,300,000/-** | **117,081,361/-** | **4,781,361/-** |

## 15. මූල්‍ය කටයුතු හැසිරවීම් පිළිබඳ විශ්ලේෂණය 2012

| විෂය | සූත්‍රය | ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ වැය |
|---|---|---|
| (අ) ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ පුනරාවර්ථන වැය | පුනරාවර්තන වැය/ ශිෂ්‍ය සංඛ්‍යාව | 69,567/- |
| (ආ)ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ ප්‍රාග්ධන වැය | ප්‍රාග්ධන වැය/ ශිෂ්‍ය සංඛ්‍යාව | 13,315/- |
| **එකතුව** | | **82,882/-** |

## 16. 2012 වර්ෂය තුලදී ලත් යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වැය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| වායුසමීකරණ ස්ථාපනය කිරීම | 2,049,628.84 | නිමකරනලදී |
| පරිගණක ජාල පහසුකම් | 7,625.00 | නිමකරනලදී |
| නව ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 82,358.61 | නිමකරනලදී |
| පාලන අංශයේ විදුලි ස්ථාපනය කිරීම | 65,755.20 | නිමකරනලදී |

## 17. වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආතනයේ කාර්ය සාධනය

1980-2011 කාලය තුළ දී වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආතනය විසින් අභ්‍යාසලාභීන් 7984 දෙනෙකු පුහුණු කොට ඇත (වගු අංක 01)

**වගු අංක1 1980-2012 කාලය තුළ දී පුහුණු කරන ලද අභ්‍යාසලාභීන් පිලිබඳ විස්තර**

| | 1980-2011 | 2012 | එකතුව |
|---|---|---|---|
| වෛද්‍ය විශාරද / වෛද්‍යපති උපාධිධාරීන් සංඛ්‍යාව | 3826 | 226 | 4052 |
| විද්‍යාපති උපාධිධාරීන් සංඛ්‍යාව | 764 | 68 | 832 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව | 3394 | 152 | 3546 |
| පශ්චාත් උපාධිධාරීන් මුළු එකතුව | 7984 | 438 | 8422 |

**වගු අංක 2 2012 වර්ෂය තුල දී පුහුණුව ලද අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**

**වගු අංක 2.1 2012 වර්ෂයේ නව ප්‍රවේශක අභ්‍යාසලාභින් සංඛ්‍යාව**

| **2012 වර්ෂයේ නව ප්‍රවේශක සංඛ්‍යාව** | **අභ්‍යාසලාභින් සංඛ්‍යාව** |
|---|---|
| සේවාස්ථ පුහුණු වැඩසටහන් (නාසාකණ්ඨස්වරාලවේදය) | 21 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 248 |
| විද්‍යාපති පාඨමාලා | 94 |
| වෛද්‍ය විශාරද පාඨමාලා | 234 |
| සහතිකපත්‍ර පාඨමාලා | 45 |
| **එකතුව** | **642** |

**වගු අංක 2.2** 2012 වර්ෂය තුල පාඨමාලා හැදෑරූ මුළු අභ්‍යාසලාභින් සංඛ්‍යාව

| **2012 වර්ෂයේ නව ප්‍රවේශක සංඛ්‍යාව** | **අභ්‍යාසලාභින් සංඛ්‍යාව** |
|---|---|
| සේවාස්ථ පුහුණු සහ සහතිකපත්‍ර පාඨමාලා | 203 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 450 |
| විද්‍යාපති පාඨමාලා | 176 |
| පූර්ව වෛද්‍ය විශාරද පාඨමාලා | 783 |
| පශ්චාත් වෛද්‍ය විශාරද (දේශීය පුහුණු) | 421 |
| පශ්චාත් වෛද්‍ය විශාරද පාඨමාලා (විදේශීය පුහුණු) | 354 |
| **මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව** | **2387** |

**වගු අංක 03: 2012 වර්ෂය තුලදී පැවැත් වූ විභාග සංඛ්‍යාව**

| **විභාගය** | **පැවැත්වූ විභාග සංඛ්‍යාව** |
|---|---|
| ප්‍රවේශ පරීක්ෂණ | 26 |
| සෙමිස්ට පරීක්ෂණ | 03 |
| මොඩියුල් I | 01 |
| මොඩියුල් II | 01 |
| මොඩියුල් III | 01 |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර | 06 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 17 |
| විද්‍යාපති | 06 |
| ප්‍රථම කොටස (අ) පරීක්ෂණ | 07 |
| ප්‍රථම කොටස (ආ) පරීක්ෂණ | 06 |
| වෛද්‍ය විශාරද ප්‍රථම කොටස පරීක්ෂණ | 07 |
| අවසන් පරීක්ෂණ/ මොඩියුල් IV | 39 |
| **එකතුව** | **111** |

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 1980 සිට 2011 දක්වා කාලය තුළ අභ්‍යාසලාභීන් 2379 දෙනෙකු හට විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් මාණ්ඩලික සහතිකය පිරිනමා ඇත. විශේෂඥ වෛද්‍යවරුන් 212 දෙදෙනෙකු එම සහතිකය ලබා ඇත්තේ 2012 වසර තුළදීය.

**වගු අංක 4 : මාණ්ඩලික සහතික ලත් විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 1980-2010**

| **විෂය ක්ෂෙත්‍රය** | **1980-2011** | **2012** | **එකතුව** |
|---|---|---|---|
| නිර්වින්දන වෛද්‍යවේදය | 173 | 20 | 193 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව | 162 | 6 | 168 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව | 14 | 1 | 15 |
| දන්ත ශල්‍යවේදය | 27 | | 27 |
| මුඛ ශල්‍යවේදය | 12 | | 12 |
| දන්ත ඍජුකරණවේදය | 24 | 2 | 26 |
| දන්ත පිළිසකරවේදය | 13 | | 13 |
| චර්ම වෛද්‍යවේදය | 50 | 6 | 56 |
| පවුල් වෛද්‍යවේදය | 18 | | 18 |
| අධිකරණ වෛද්‍යවේදය | 63 | 1 | 64 |
| කායික වෛද්‍යවේදය | 310 | 27 | 337 |
| හෘද වෛද්‍යවේදය | 44 | 4 | 48 |
| හෘද විද්‍යුත් භෞතවේදය | 03 | | 3 |
| ස්නායු වෛද්‍යවේදය | 29 | 1 | 30 |
| වෘක්කවේදය | 12 | 2 | 14 |
| ස්නායු භෞතවේදය | 02 | 1 | 3 |
| ශ්වසන වෛද්‍යවේදය | 22 | 2 | 24 |
| රක්තවාතවේදය හා පුනරුත්ථාපනය | 26 | 1 | 27 |
| ජඨරික ආන්ත්‍රිකවේදය | 05 | 2 | 7 |
| අන්තරාසර්ග වෛද්‍යවේදය | 06 | 5 | 11 |
| වෛද්‍ය පරිපාලනය | 18 | 2 | 20 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය | 64 | 1 | 65 |
| පරපෝෂිත වෛද්‍යවේදය | 05 | 1 | 6 |
| වෛරසවේදය | | 1 | 1 |
| ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය | 226 | 15 | 241 |
| මදසරුභාවය | 1 | | 1 |
| නාරිවේදමය පිළිකා ශල්‍යවේදය | 03 | 1 | 4 |
| අක්ෂි වෛද්‍යවේදය | 84 | 1 | 85 |
| අක්ෂි කාච බද්ධ ශල්‍යවේදය | | 2 | 2 |
| නාසාකණ්ඨස්වරාලවේදය | 45 | 4 | 49 |
| කෞමාරභෘත්‍යය | 224 | 19 | 243 |
| දාරක හෘද වෛද්‍යවේදය | 04 | 2 | 6 |
| දාරක ස්නායු වේදය | 04 | 1 | 5 |
| දාරක වෘක්කවේදය | 01 | | 1 |
| දාරක දැඩිසත්කාර | 01 | 1 | 2 |
| නවජ සූති වෛද්‍යවේදය | 03 | 1 | 4 |
| පටක ව්‍යාධිවේදය | 84 | 11 | 95 |
| රුධිර ව්‍යාධිවේදය | 49 | 6 | 55 |
| රසායනික ව්‍යාධිවේදය | 09 | 2 | 11 |
| රුධිර පාරවිලයන වෛද්‍යවේදය | 10 | 2 | 12 |
| මනෝ වෛද්‍යවේදය | 63 | 6 | 69 |
| විකිරණ වේදය | 119 | 16 | 135 |
| සායනික නියෝප්ලාස්මවේදය | 30 | 1 | 31 |
| ශල්‍ය වෛද්‍යවේදය | 171 | 14 | 185 |
| හෘද උරස් ශල්‍යවේදය | 18 | 1 | 19 |
| පිළිකා ශල්‍යවේදය | 11 | 3 | 14 |
| මෞත්‍ර ලිංගික ශල්‍යවේදය | 19 | 1 | 20 |
| ජඨරික ආන්ත්‍රික ශල්‍යවේදය | 12 | 2 | 14 |
| ස්නායු ශල්‍යවේදය | 15 | 2 | 17 |
| විකලාංග ශල්‍යවේදය | 40 | 5 | 45 |
| දාරක ශල්‍යවේදය | 14 | | 14 |
| සුවිකාරක ශල්‍යවේදය | 07 | 3 | 10 |
| වාහිනීමය හා ඉන්ද්‍රිය බද්ධ ශල්‍යවේදය | 05 | 2 | 7 |
| උරස් ශල්‍යවේදය | 02 | | 2 |
| මෞත්‍රික හා වෘක්කීය බද්ධ ශල්‍යවේදය | 01 | 1 | 2 |
| සමාජරෝගවේදය | 02 | 1 | 3 |
| **එකතුව** | *2379* | *212* | *2591* |

**ඇමුණුම 02 - වගු අංක 5**

2011 වර්ෂය තුලදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා ලේඛනගත වී සිටි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව (31-12-2011 දක්වා)

| | නව ප්‍රවේශ | සේවාස්ථ/ ඩිප්ලෝමා | | විද්‍යාපති | පූර්ව MD/ MS | පශ්චාත් MD/MS | පශ්චාත් MD/MS | | මුළු එකතුව 1+2+3+4 +5 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සේ/ස | ඩි | | | දේශීය | විදේශීය 5 | | |
| | | 1 | | 2 | 3 | 4 | 2 අවු තෙක් | 3වන අවු. | |
| නිර්වින්දන වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 18 | - | - | - | 61 | 24 | 18 | 7 | 110 |
| සායනික නියෝප්ලාස්මවේදය (සේවාස්ථ පුහුණු) | 4 | 6 | - | - | - | - | - | - | 7 |
| සායනික නියෝප්ලාස්මවේදය (වෛද්‍ය විශාරද) | 7 | - | - | - | 11 | 8 | 6 | 2 | 27 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව (විද්‍යාපති) | 35 | - | - | 35 | - | - | - | - | 35 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | 17 | - | - | - | 59 | - | 13 | 1 | 73 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව (විද්‍යාපති) | 5 | - | - | 5 | - | - | - | - | 5 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | - | - | - | - | 5 | - | 2 | - | 7 |
| චර්ම වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 5 | - | - | - | 16 | 8 | 8 | 1 | 33 |
| මුඛ ශල්‍යවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 1 | - | - | - | 7 | 3 | 2 | - | 12 |
| දන්ත පිලිසකරවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 5 | - | - | - | 14 | - | - | - | 14 |
| දන්ත ඍජුකරණවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 1 | - | - | - | 8 | - | - | - | 8 |
| විකලාංග ශල්‍යවේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 10 | 19 | - | - | 29 |
| පශ්චාත් උපාධි රෝහල් දන්ත වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | - | - | 27 | - | - | - | - | - | 27 |
| පශ්චාත් උපාධි පවුල් වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | 55 | - | 55 | - | - | - | - | - | 55 |
| පවුල් වෛද්‍ය වේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 10 | 4 | - | - | 14 |
| නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 12 | - | 25 | - | - | - | - | - | 25 |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | - | - | - | - | 8 | 11 | 2 | - | 21 |
| වෛද්‍ය පරිපාලනය (විද්‍යාපති) | 21 | - | - | 41 | - | - | - | - | 41 |
| වෛද්‍ය පරිපාලනය ( වෛද්‍ය විශාරද) | - | - | - | - | 29 | - | 1 | - | 29 |
| කායික වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 38 | - | - | - | 130 | 130 | 62 | 3 | 325 |
| ක්ෂය රෝගය හා ලය රෝග පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 19 | - | 29 | - | - | - | - | - | 29 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 7 | - | - | - | 26 | 10 | 8 | 1 | 45 |
| පරපෝෂිත වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 1 | - | - | - | 1 | - | - | - | 1 |
| වෛරස වේදය පිළිබඳ වෛද්‍යවේදය | - | - | - | - | 4 | 2 | - | - | 8 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 10 | - | 20 | - | - | - | - | - | 20 |
| සායනික ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය පිළිබද ප/උ ඩිප්ලෝමාව | - | - | 5 | - | - | - | - | - | 5 |
| අණුක වෛද්‍යවේදය පිළිබද ප/උ ඩිප්ලෝමාව | 16 | - | 16 | - | - | - | - | - | 16 |
| අණුක වෛද්‍යවේදය (විද්‍යාපති) | - | - | - | 12 | - | - | - | - | 12 |
| ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය (වෛද්‍ය විශාරද) | 7 | - | - | - | 23 | 17 | 22 | 1 | 63 |
| ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 8 | - | 17 | - | - | - | - | - | 17 |
| අක්ෂි වෛද්‍යවේදය (සේවාස්ථ පුහුණු) | 21 | 83 | - | - | - | - | - | - | 83 |
| අක්ෂි වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 12 | - | - | - | 23 | 7 | 6 | - | 36 |
| නාසාකණ්ඨස්වරාලවේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 9 | 1 | 6 | - | 16 |
| රසායනික ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | 2 | - | - | - | 6 | 5 | 4 | 1 | 16 |
| රුධිර ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | 6 | - | - | - | 10 | 10 | 13 | 1 | 34 |
| පටක ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | 4 | - | - | - | 13 | 6 | 6 | 3 | 28 |
| රසායනික ව්‍යාධිවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 2 | - | 6 | - | - | - | - | - | 6 |
| රුධිර ව්‍යාධිවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 14 | - | 23 | - | - | - | - | - | 23 |
| පටක ව්‍යාධිවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 10 | - | 15 | - | - | - | - | - | 15 |
| මුඛ ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | 1 | - | - | - | 1 | - | - | - | 1 |
| රුධිර පාරවිලයන වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 4 | - | - | - | 11 | 4 | 5 | - | 20 |
| රුධිර පාරවිලයන පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 5 | - | 14 | - | - | - | - | - | 14 |
| කෞමාරභෘත්‍යය (වෛද්‍ය විශාරද) | 16 | - | - | - | 76 | 54 | 30 | 3 | 163 |
| ළමා සෞඛ්‍ය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 38 | - | 38 | - | - | - | - | - | 38 |
| මනෝ වෛද්‍යවේදය පිළිබද ප/උ ඩිප්ලෝමාව | - | - | 21 | - | - | - | - | - | 21 |
| මනෝ වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 17 | - | - | - | 62 | 16 | 21 | 4 | 103 |
| විකිරණවේදය (සේවාස්ථ පුහුණු) | 17 | 34 | - | - | - | - | - | - | 34 |
| විකිරණවේදය (වෛද්‍ය විශාරද) | 14 | - | - | - | 30 | 25 | 17 | 5 | 77 |
| ක්‍රීඩා වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 10 | - | 10 | - | - | - | - | - | 10 |
| ශල්‍ය වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 25 | - | - | - | 104 | 52 | 57 | 2 | 215 |
| සමාජ රෝගවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 6 | - | 19 | - | - | - | - | - | 19 |
| සමාජ රෝගවේදය (වෛද්‍ය විශාරද) | 5 | - | - | - | 16 | 5 | 9 | - | 30 |
| පවුල් වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව (මාර්ග ගත) | 27 | - | 74 | - | - | - | - | - | 74 |
| සංකටක සත්කාර වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 16 | - | 36 | - | - | - | - | - | 36 |
| මූලික රසායනාගාර විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 22 | 46 | - | - | - | - | - | - | 46 |
| ජෛව විඥාපන විද්‍යාපති පාඨමාලාව | 12 | - | - | 62 | - | - | - | - | 62 |
| වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | - | 11 | - | - | - | - | - | - | 11 |
| විෂවෛද්‍යවේදය විද්‍යාපති පාඨමාලාව | 21 | - | - | 21 | - | - | - | - | 21 |
| පරිගණක යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 23 | 23 | - | - | - | - | - | - | 23 |
| **එකතුව** | **642** | **203** | **450** | **176** | **783** | **421** | **319** | **35** | **2387** |

## 18. අධ්‍යයන කටයුතු

**ලේඛණාරූඪ කිරීම්**

2012 වසර තුළදී නව ප්‍රවේශයකින් 642 දෙනෙක්ද සහිතව අභ්‍යාසලාභීන් 2387 දෙනෙකු වෛද්‍ය විශාරද, වෛද්‍යපති, පශ්චත් උපාධි ඩිප්ලෝමා, සහතිකපත්‍ර කුසලතා සහතික පත්‍ර පුහුණු පාඨමාලාවන් හැදෑරීමට ලේඛණාරූඪ විය. (වගුව 2) මේ අය අතුරෙන් පුහුණුවන්නන් 2033ක් පුහුණු වැඩ සටහන්/ අධ්‍යයන පාඨමාලා දේශීය වශයෙන් හදාරන අතර පුහුණු වන්නන් 354ක් විදේශීය මධ්‍යාස්ථානවල පුහුණුවීම් ලබති.

**2012 වර්ෂය තුළ අධ්‍යයන අවධාරණය**

2012 වර්ෂයේදී අධ්‍යයන කටයුතු පිළිබඳ අවධාරණය යොමුවුයේ නව පුහුණුවීම් වැඩ සටහන් ඉදිරිපත් කිරීම සහ දැනට පවත්නා පුහුණු වැඩසටහන් වල තත්වය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සමාන්තර විෂය ධාරාවන්ට වඩා උසස් කිරීම සඳහා විෂය මාලාවන් සහ නිර්දේශ විස්තර මාලාවන් ප්‍රතිශෝධනය කිරීම සඳහා ය. එසේම පුහුණුකරවන්නන්ගේ පුහුණුකරවීම් සහ නිපුනතාවයන් වැඩි දියුණු කරදීම සඳහා නව ක්‍රමෝපායයක් හඳුන්වා දීමටය.

පුහුණු කරවන්නන්ට නව දැණුම ලබාදීම සඳහා සහ මෙම වැඩ සටහන්වල පිළිගත් තත්ත්ව සහ ප්‍රමිතීන්ට අනුව මනා ක්‍රියාකාරිත්වය සඳහා විවිධ මාතෘකා අනුව වැඩ මුළු ගනනාවක් වර්ෂ පුරාම පවත්වන ලදි.

**නව වැඩසටහන්**

2012 වර්ෂය තුළදී පහත සඳහන් නව පුහුණු වැඩ සටහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකරන ලදි.

- හදිසි වෛද්‍ය වේදය පිළිබඳ වෛද්‍ය විශාරද
- මානුෂීය පෝෂණය පිළිබඳ විද්‍යාපති
- සෞඛ්‍ය ක්ෂේත්‍ර ආපදා කළමණාකරණය ඩිප්ලෝමා
- කායව්‍යාවඡේවද ඩිප්ලෝමා
- භෞතවේදය පිළිබඳ ඩිප්ලෝමා
- වයෝ වෘදධ වෛද්‍ය වේදය පිළිබඳ ඩිප්ලෝමා

දැනට පවත්නා වැඩ සටහන්වල පහත සඳහන් විෂය මාලාවන් සහ නිර්දේශ විස්තර මාලාවන් ප්‍රතිශෝධනය කරන ලදි.

- ප්‍රසව හා නාරිවේද පිළිබඳ වෛද්‍ය විද්‍යා නිශාරස
- වෛද්‍ය වේදය අධයාපනය පිළිබඳ වෛද්‍ය විද්‍යා විශාරද සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා
- වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා සහ සායනික ක්ෂුද්‍රජීව විද්‍යා විශාරද
- පවුල් වෛද්‍ය වේදය පිළිබඳ ඩිල්ලෝමා සායනික සහ පුහුණු පවුල් වෛද්‍ය විශාරද සහ නිබන්ධන වැඩ සටහන් යටතේ පවුල් වෛද්‍ය විද්‍යා විශාරද
- පාරමිලියන වෛද්‍ය පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ විද්‍යා විශාරද

**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනතට සංශෝධනය**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආඥාපනතට සංශෝධන අවසන් කර සනාතන සභාවේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

**අධ්‍යයන මණ්ඩල, විශේෂිත මණ්ඩල සහ වෙනත් කොමිටු ප්‍රතිස්ථාපනය කිරීම**

2012 වර්ෂය තුල දී අධ්‍යයන මණ්ඩල, විශේෂිත මණ්ඩල, අධ්‍යයන කටයුතු, පිළිගැනීම්, පරීක්ෂණ සහ විනය (AAAEDC) මුදල් සහ කළමණාකරන කොමිටුව, විගණන කොමිටුව පිළිබඳ ස්ථාවර කොමිටු ප්‍රතිස්ථාපනය කරන ලදී. අධ්‍යයන මණ්ඩලයේ සහ අනෙක් කොමිටුවල සාමාජික භවතුන්ගේ නිල කාලය 2012 ජුනි මස සිට වසර තුනකි. විශේෂිත මණ්ඩලවල ප්‍රතිස්ථාපනය 2012 අගෝසතු / සැප්තැම්බර් වලදී සිදු කරන ලදි.

**පැමිණිලි කොමිටුව ස්ථාපිත කිරීම**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් තුළ ඇතිවන ගැටලු, ප්‍රශ්ණ විසඳීම සඳහා නඩු මගට අවතීර්න විම අවම කිරීම සඳහා පහත සඳහන් සාමාජික භවතුන්ගෙන් සමන්විත පැමිණිලි කොමිටුවක් ස්ථාපිත කරන ලදි.

- විනිසුරු එම්.එස්.යාපා මහතා
- මහාචාර්ය එම්.සිවසුරිය මහතා
- මහාචාර්ය ඊවා තාබෘ මහත්මිය

**සදාචාරාත්මක සමාලෝචන කොමිටුව සංස්ථාපිත කිරීම**

සනාතන සභාවේ අනුමැතිය ඇතිව, සාමාජික භවතුන් 12 දෙනෙකුගෙන් සමන්විත සදාචාරාත්මක සමාලෝචන කොමිටුව ස්ථාපිත කරන ලදි. මෙය ප්‍රධාන වශයෙන් තමන්ගේ පුහුණුවීම්වල එක් කොටසක් ලෙස පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට ඇති වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් සඳහා සහයෝගය ලබාදීම සඳහා ය. සදාචාරාත්මක සමාලෝචන කොමිටුව විසින් නියමකරන ලෙස මෙහෙයුම් නිර්නායක අනුව අදාල විස්තර ඉදිරිපත් කිරීමෙන් සදාචාරාත්මක සමාලෝචන කොමිටුවේ සදාචාරාත්මක බව පිළිගැනෙනු ඇත.

**පුහුණුවන්නන් සඳහා ඇගයීම් යාන්ත්‍රනයක් හදුන්වාදීම**

පුහුණුවන්නන්ගේ 360 ප්‍රමාණයේ ඇගයීම් සම්බන්ධ පියර් කණ්ඩායම් ඇගයීම් ක්‍රියාවලිය බහු මූලාශ්‍ර පසු විපරම හදුන්වාදීම සඳහා ඇමරිකානු එක්සත් රාජයයේ සහ එක්සත් රාජධානියේ ක්‍රියාත්මක වන එක් ක්‍රමයකි. මෙය පුහුණුකරුවන් අනුයුක්ත කරනු ලබන ඒකකවල හැසිරීමේ ආකාරයන්, ආකල්ප, සන්නිවේදන හැකියාවන් නායකත්ව කුසලතා අන්තර්ග්‍රහණය කිරීම, කණ්ඩායම් තුල කටයුතු කිරීමේ කුසලතා ආදිය ඇගයීම් සඳහා උපයෝගීකරගනු ලැබේ.

**කළමණාකරන උපදේශකවරයකුගේ සේවාවන්**

නව විශේෂඥතාවයන් සහ නව ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමත් සමගම නුදුරු අනාගතයේ දී අපේක්ෂා කරන ව්‍යාප්ති කටයුතු සම්බන්ධයෙන් අවශ්‍යවන ශ්‍රම සම්පත් අවශ්‍යතා අධ්‍යයනය කිරීම සඳහා කළමණාකරන උපදේශකවරයෙකුගේ සේවාවන් ලබා ගැනීමට කටයුතු කරන ලදි.

**කෝප් (COPE) කොමිටු රැස්වීම**

2012 අගෝස්තු 16 දිනට නියමිතව තිබූ කෝප් කොමිටු රැස්වීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිලධාරීන් සහභාගී වුහ. 2011 වර්ෂය තුල වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යය සාධනය පිළිබඳ කෙටි විස්තරයක් අධ්‍යක්ෂකතුමා විසින් ඉදිරිපත් කරන ලදි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ අහිතකර ප්‍රකාශන කිසිවක් නොවීය.

**2013 වර්ෂය සඳහා ගාස්තු ක්‍රමය සංශෝධනය කිරීම**

කළමණාකරන මණ්ඩලයේ තීරණයන් පරිදි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගාස්තු ක්‍රමය සංශෝධනය කරන ලද අතර එය 2013.01.01 සිට ක්‍රියාත්මක කරනු ඇත.

**ගරුනාම ප්‍රදානෝත්සවය සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රීය දේශනය**

ගරුනාම ප්‍රදානය සඳහා එකම විද්වතෙක් පමණක් සිටිය හෙයින් සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශාස්ත්‍රීය දේශනයට සුදුසු මාතෘකාවක් ඉදිරිපත් නොවුන හෙයින් ගරුනාම ප්‍රදානෝත්සවය සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ශාස්ත්‍රීය දේශනය 2012 වර්ෂය සඳහා නොපැවැත් වුනි.

**18.1 වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය**

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට 2012 වර්ෂයට තවත් ඵලදායී වර්ෂයක් විය. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ බොහෝ ක්‍රියාකාරකම්වලදී වෛද්‍ය අධ්‍යාපන මධ්‍යස්ථානය ප්‍රමුඛත්වය ලබාදුනි.

වෛද්‍ය ශසිනිකා ද අල්විස්, වෛද්‍ය ඉසුරු බාලසූරිය, වෛද්‍ය දිනිඳු රණසිංහ වෛද්‍ය සත්සරණී අමරසිංහ 2011/ 2012 වර්ෂය සඳහා වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යාස්ථානයට සම්බන්ධ වූ ප්‍රදර්ශකවරුන් ලෙස සේවය කොට සේවා කාලය අවසන් වීමෙන් අනතුරුව 2012 දෙසැම්බර් සිට වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් පූර්ව සීමාවාසික ප්‍රදර්ශකවරුන් ලෙස වෛද්‍ය ඇන්පිලා විජයරත්න, වෛද්‍ය සජීව් ශෙල්වකුමාර්, වෛද්‍ය වරුනි මල්ලිකාරච්චි බඳවා ගන්නා ලදි.

ආරම්භයේ සිටම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුවත් පත්‍රිකාව සැලසුම් කොට ප්‍රකාශයට පත්කරන ලද්දේ වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් වන අතර මෙම ප්‍රසංසනීය සම්ප්‍රදාය ඉදිරියට ගෙන යමින් පුවත් පත්‍රිකාවේ වෙලුම හතරක් 2012 වර්ෂයේ දීද ප්‍රකාශයට පත් කරන ලදි. වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ, අලුතෙන් ආරම්භ කළ පාඨමාලා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් වර්ෂය තවත් ඵලදායී විය. බහු විෂය අධ්‍යයන පාඨමාලා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය සහ මූලික සහ වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය වැනි විශේෂඥ මණ්ඩලවලට අදාල සියළු ක්‍රියාකාරකම් වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරන ලදි.

**වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරන ලද පාඨමාලා**

මුඩ්ල් (MOODLE) ඉගෙනීම් කළමණාකරන ක්‍රමය උපයෝගීකර ගනිමින් මංගත (online) උස්තලාව පදනම් කරගත් දුරස්ථ ඉගෙනීම් වැඩ සටහන් වන වෛද්‍ය වේදය විෂ අධ්‍යයන විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව සඳහා සිසුන් 21 දෙනෙකුගෙන් සමන්විත 2 වන කණ්ඩායම ඔවුන්ගේ අධ්‍යයන කටයුතු 2012 මාර්තු මස ආරම්භ කරන ලදී.

2013 මුල් භාගයේ පාඨමාලාව ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් දැඩි සත්කාර වෛද්‍ය විද්‍යා 4 වන කණ්ඩායම සඳහා වූ තේරීම් පරීක්ෂණය 2012 නොවැම්බර් මස පවත්වන ලදි. දැඩි සත්කාර වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමා තුන්වන කණ්ඩායමේ අවසන් පරීක්ෂණය 2012 දෙසැම්බර් මස පවත්වන ලදි. එක් අවුරුදු ඩිප්ලෝමා වැඩ සටහන සාර්ථකව නිම කරන ලද තුන්වන කණ්ඩායමේ සියළුම පුහුණුවන්නන් ඔවුන්ගේ සනාථගතකිරීම් සඳහා ආපසු සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි.

පවුල් වෛද්‍ය විද්‍යා මංගත (online) තෙවන කණ්ඩායම 2012 නොවැම්බර් මස ඔවුන්ගේ පරීක්ෂණය සඳහා පෙනී සිටි අතර දැනට හතරවන පවුල් වෛද්‍ය විද්‍යා මංගත කණ්ඩායම පාඨමාලාව හදාරමින් සිටී.

වෛද්‍ය විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර තෙවන කණ්ඩායම 2012 වර්ෂයේ දී පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලදි. මෙය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවකට යොමු වන හය මසක අර්ධ කාලීන පාඨමාලාවකි. වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ වෛද්‍ය විද්‍යා විශාරද වැඩ සටහන 2012 අගෝස්තු මස ආරම්භ විය.

